# සමාජ විද්‍යා අධ්‍යයනාංශය

## ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

# මාසික සම්මන්ත්‍රණ මාලාව - මාර්තු 2022

**2022**
**මාර්තු 16**
**වනදා පස්වරු**
**03.00 සිට**
**04.00 දක්වා**

zoom

https://learn.zoom.us/j/65185378767?pwd=akxVaDBWdlV5Ryt2MDVoQS80K3Q3QT09

Meeting ID : 651 8537 8767
Passcode : h803!JdJ

**මාධ්‍යය: සිංහල**

## " ශ්‍රී ලංකාවේ ජල දේශපාලන: රතුපස්වල පානීය ජලය අපවිත්‍ර වීමට එරෙහි මහජන විරෝධතාව පිළිබඳ සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක් "

ජලය පිළිබඳ විවිධ මත දරන්නන් සිටින අතර එක් පුද්ගලයෙක් තුළ ද ඒ පිළිබඳ විවිධ අදහස් දක්නට ලැබේ. ජලය සම්බන්ධ ව්‍යාපෘති හා සංවර්ධන දේශපාලනය මුල්කොටගත් ගැටුම් ලොව පුරා දක්නට ලැබේ. දේශපාලන පාරිසර විද්‍යාත්මක පර්යාලෝකයට අනුව පානීය ජල අර්බුදය පිළිබඳ ලොව පුරා බිම් මට්ටමේ විවිධ ජල දේශපාලනයන් හා පාරිසරිකවාද නිර්මාණය කොට තිබේ. මෙහිදී සාකච්ඡාවට ලක්වන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ වැලිවේරිය ගම්මානයේ කර්මාන්ත ශාලාවක් මුල්කොටගෙන පානීය ජලය අපවිත්‍ර වීම හේතුවෙන් ඇති වූ මහජන විරෝධතාවන් පිළිබඳ අධ්‍යයනයකි. මෙම අර්බුදය ජාතික මට්ටමේ දේශපාලන ප්‍රශ්නයක් බවට පත් වූ අතර එය ජිනීවා මානව හිමිකම් කොමිසමේ ද සාකච්ඡාවට භාජනය විය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වූයේ ජලය සම්බන්ධ අර්බුදයකදී සාමූහික මහජන විරෝධතාවන් ඇතිවීමට බලපාන ලද සාධක ගවේෂණය කිරීමයි. දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම ලෙස ප්‍රශ්නාවලි (100) ගැඹුරු සම්මු සාකච්ඡා (25) සහ පුවත්පත් අන්තර්ගත විශ්ලේෂණයන් යනාදිය යොදා ගැනුණි. මෙම ප්‍රදේශයේ ඉදිකරන ලද කර්මාන්ත ශාලාව ජනතාවට පුද්ගලික ආර්ථික වශයෙන් ප්‍රතිලාභ ගෙන දුන්න ද දුන්න ද මෙම ප්‍රදේශයේ පානීය ජල දූෂණයට මෙම කර්මාන්ත ශාලාව හේතු වූ බව බහුතර ජනතාවගේ විශ්වාසය විය.රතුපස්වල මහජන ව්‍යාපාරය ගම්වාසීන්ගේ පාරිසරික ප්‍රජාතන්ත්‍රවාදය පදනම් කරගත් මධ්‍යම පාන්තික පාරිසරිකවාදය තුළින් ක්‍රියාත්මක වූවකි. උගත් මධ්‍යම පාන්තිකයන් ව්‍යාපාරික ප්‍රජාවේ සහාය ඇතිව දේශපාලන වශයෙන් ශක්තිමත් වූ බලයට විරුද්ධව ප්‍රජාව ඒකරාශී කළේය. ශ්‍රී ලාංකේය පාරිසරික වාදයේ අනන්‍යතාවක් ලෙස එම ප්‍රදේශයේ දක්නට ලැබුණු පාරිසරික දේශපාලනය ජල දූෂණයට එරෙහි වූ මහජන විරෝධතා උද්ඝෝෂණයන් නිර්ණය කළේ ය. මීට අමතරව අධ්‍යාත්මික පාරිසරිකවාදය හා පාරිසරික අභිචාර ක්‍රියාවන් ද මෙම උද්ඝෝෂනය තුළ හඳුනාගත හැකි විය. මෙවන් බිම්මට්ටමේ සාමූහික ක්‍රියාවන් නූතන පාරිසරික න්‍යාය තුළ පාරිසරිකවාදී නොවන ලෙස හඳුනාගත්ත ද පශ්චාත් නූතනවාදී තත්ත්වයන් යටතේ ඒවා බිම් මට්ටමේ පාරිසරික වාදයන් ලෙස පිළිගත හැකි ය.


## ආචාර්ය එම්.ටී.එම්. මහීස්

සමාජවිද්‍යා අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය කොළඹ විශ්වවිද්‍යාලය




*ආචාර්ය එම්. ටී. එම්. මහීස් මහතා දැනට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙක් වශයෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ කලා පීඨයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයට අනියුක්තව සේවය කරයි. ඔහු සිය ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය 1999 වර්ෂයේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ද පාරිසරික සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2007 වර්ෂයේදී වර්ෂයේ දී කොළඹ විශ්ව විද්‍යාලයෙන් ද ජල සම්පත් කළමනාකරණය පිළිබඳ දර්ශනශූරී උපාධිය 2011 වර්ෂයේ නෙදර්ලන්තයේ Crossing Boundaries ව්‍යාපෘතිය යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පශ්චාත් උපාධි පීඨයෙන් මෙන් ම කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයෙන් 2017 වර්ෂයේ දී උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා ඇත. මේ වන විට ඔහු විසින් පලකරන ලද ග්‍රන්ථ අතර පාරිසරික ව්‍යාපාර (2010), සංවර්ධන සමාජ විද්‍යාව; හැඳින්වීමක් (2020)දේශපාලන පරිසර විද්‍යාව (2020) සමාජ ගැටලු (සංස්) (2021) සහ සමාජ විද්‍යාත්මක න්‍යාය (2021) යන කෘතීන් පෙන්වා දිය හැකිය.*


සමාජ විද්‍යා අධ්‍යයනාංශය ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ 03
+94 (0) 112 500452
seminars@soc.cmb.ac.lk